# නේෂන්ස් සැලරි සේවර්

## නියමයන් සහ කොන්දේසි

නේෂන්ස් ට්‍රස්ට් බැංකුව පීඑල්සී ( "බැංකුව") ට පහත කරුණු සඳහා තනි සහ පරම අභිමතය පැවතිය යුතු බව අවබෝධ කරගන්න.

i නේෂන්ස් සැලරි සේවර් යටතේ ප්‍රතිලාභ, වරප්‍රසාද සහ/හෝ පහසුකම් ප්‍රදානය කරනු ලැබීම සඳහා අවශ්‍ය සියලුම නිර්ණායකයන් මා විසින් සපුරා තිබුණ ද, කිසිදු හේතු දැක්වීමකින් තොරව එම ඕනෑම ප්‍රතිලාභයක්, වරප්‍රසාදයක් සහ/හෝ පහසුකමක් සම්පූර්ණයෙන්ම හෝ කොටසක් ප්‍රදානය කිරීම ප්‍රතික්ශේප කිරීමට.

ii කිසිදු හේතු දැක්වීමකින් තොරව නේෂන්ස් සැලරි සේවර් යටතේ මා හට ප්‍රදානය කරන ලද ඕනෑම ප්‍රතිලාභයක්,වරප්‍රසාදයක් සහ/හෝ පහසුකමක් ඕනෑම අවස්ථාවක නතර කිරීමට.

iii නේෂන්ස් සැලරි සේවර් යටතේ වන ප්‍රතිලාභ, වරප්‍රසාද සහ/හෝ පහසුකම් හෝ එම ප්‍රතිලාභ, වරප්‍රසාද සහ/ හෝ පහසුකම් ප්‍රදානය කරනු ලැබීමට සපුරාලිය යුතු නිර්ණායක ඕනෑම අවස්ථාවක වෙනස්කිරීමට, නවීකරණය කිරීමට, සංශෝධනය කිරීමට සහ/හෝ වෙනස් කිරීමට.

iv මා වෙත ඇති සන්නිවේදනය ද සමග ඕනෑම අවස්ථාවක නේෂන්ස් සැලරි සේවර් ගිණුම අවසන් කිරීමට, ඉල්ලා අස්කර ගැනීමට සහ/හෝ අවලංගු කිරීමට.

v මාගේ මාසික වැටුප නේෂන්ස් සැලරි සේවර් ගිණුමට ක්‍රමවත් පදනමකින් ප්‍රේෂණය කිරීමට මා අපොහොසත් වුවහොත් බැංකුවේ තනි අභිමතය පරිදි මාගේ නේෂන්ස් සැලරි සේවර් ගිණුම, නේෂන්ස් සේවර් ගිණුමක් බවට පත්කළ හැකිබව මා පිළිගන්නා අතර ඒ සඳහා එකඟ වේ.

vi නේෂන්ස් සැලරි සේවර් ගිණුම ඉහත ප්‍රකාශ කළ පරිදි නේෂන්ස් සේවර් ගිණුමක් බවට පත්කරන ලද අවස්ථාවකදී නේෂන්ස් සැලරි සේවර් ගිණුම යටතේ පිරිනමන ලද ප්‍රතිලාභ සහ පහසුකම් ඉවත්විය හැකි බවට එකඟ වෙමි. කෙසේවුවද, එම ප්‍රතිලාභ සහ/හෝ පහසුකම් උපයෝජනය කිරීම හේතුවෙන් පැනනැඟිය හැකි සියලුම බැඳීම් මා හට අඛණ්ඩව අදාළවන බවට එකඟ වෙමි.

2. මාගේ ශුද්ධ වැටුප නේෂන්ස් සැලරි සේවර් ගිණුමට බැර කිරීමට මා මෙයින් එකඟ වෙමි.

3. නේෂන්ස් සැලරි සේවර් යනු ප්‍රකාශන ඉතුරුම් ගිණුමක් බව මා අවබෝධ කර ගනිමි.

4. මෙම අයදුම් පත්‍රය, අලෙවි විස්තර පත්‍රිකා, අත් පත්‍රිකා සහ බැංකුවේ වෙනත් පත්‍රිකා සහ ලේඛන මගින් සන්නිවේදනය වන නේෂන්ස් සැලරි සේවර් නියමයන් හා කොන්දේසි සහ විශේෂිත කරුණු අවබෝධ කරගෙන, පිළිගෙන බැඳී සිටීමට එකඟ වන අතර ඒවා මා වෙත පරෙ දැනුම්දීමකින් තාරව වෙනස් වීමට යටත්වන බව පිළිගෙන එකඟ වෙමි.

5. නේෂන්ස් සැලරි සේවර් ගිණුම යටතේ පිරිනමනු ලබන ප්‍රතිලාභ, වරප්‍රසාද සහ/හෝ පහසුකම් සඳහා වන මාගේ ඉල්ලීම්, බැංකුවේ ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටීන්ට යටත් විය යුතුබවට මා එකඟ වන අතර ඒ සඳහා බැඳී සිටින අතර එම ඉල්ලීම් බැංකුවේ තනි අභිමතය පරිදි ප්‍රතික්ශේප කිරීමට බැංකුවට අයිතිය ඇත.

6. මා විසින් නේෂන්ස් සැලරි සේවර් ගිණුමක් විවෘත කරනු ලබන විට, ජංගම ගිණුමක් විවෘත කිරීමට ද මා සුදුසුකම් ලබන බව පිළිගනිමි. කෙසේවුවද, එම ජංගම ගිණුම, එම අවස්ථාව වන විට පවතින බැංකුවේ නියමයන්ට හා කොන්දේසිවලට යටත් විය යුතුය.

7. නේෂන්ස් සැලරි සේවර් ගිණුම යටතේ විශේෂිතවම අත්හැර නොමැතිනම්, නේෂන්ස් සැලරි සේවර් ගිණුම යටතේ පිරිනමනු ලබන සියලුම පහසුකම්/ අගය එකතුකළ සේවාවන්, එම බැංකු

පහසුකම්/අගය එකතු කළ සේවාවන් වලට අදාළ වන නියමයන් සහ කොන්දේසි වලට යටත් විය යුතුය.

8. නේෂන්ස් සැලරි සේවර් නියමයන් හා කොන්දේසි සහ විශේෂාංගයන්ට සිදුකරනු ලබන යම් වෙනස්කමක්( වෙනස්කම්) පිළිබඳව, ප්‍රකාශ කිරීමෙන් හෝ ප්‍රකාශනයක් එවීම මගින් හෝ එකී වෙනස් කිරීම පිළිබඳ දැන්වීම ශ්‍රී ලංකාවේ ප්‍රකාශයට පත් කෙරෙන පුවත්පත් එකක හෝ කිහිපයක පළ කිරීම මගින් හෝ බැංකුවේ ශාඛාවන්හි දැන්වීම් පුවරුවේ පළ කිරීම මගින් මවෙත සන්නිවේදනය කළ හැකි බව මා අවබෝධ කරටගන පිළිගන්නා අතර ඒ සඳහා එකඟ වෙමි.මේ යටතේ තැපැල් මගින් එවනු ලබන යම් දැන්වීමක්, අවසන් වරට සටහන් වී ඇති ලිපිනයට තැපැල් කර දින 7ක් තුළ ලැබුණු ලෙස සළකනු ඇත.

9.

(I) බැංකුව සමග සිදුකළ යුතු සෑම ලිපි හුවමාරුවකම සහ සියලුම මුදල් තැන්පත් කිරීමේ සහ ආපසු ගැනීමේ පත්‍රිකාවල සඳහන් කළ යුතු අංකයක් නේෂන්ස් සැලරි සේවර් ගිණුමට ලැබෙණු ඇත.එසේ ලබා දෙන අංකය මා වෙත කරනු ලබන දැනුම්දීමකින් පසුව වෙනස් කිරීමේ අයිතිය බැංකුව සතුවේ.

(II) ප්‍රකාශන චක්‍රය අවසානවීමේ සිට දින 10ක් තුළ ගිණුම් ප්‍රකාශය නොලැබුණි නම් ඒ පිළිබඳව බැංකුවට දැනුම් දිය යුතු බව මා අවබෝධ කර ගන්නා අතර සටහන්වල නිරවද්‍යතාවය තහවුරුකර ගැනීම සඳහා සෑම ගිණුම් ප්‍රකාශයක්ම පරීක්ෂාකර බැලීමට එකඟ වෙමි.යම් වරදක් තිබෙනම් ප්‍රකාශය ලැබී දින 14ක් තුළ බැංකුවට දැනුම් දිය යුතුය.

(III) මාගේ ගිණුම් ප්‍රකාශ සුරකිව තබා ගැනීම පිළිබඳව මම වගකියමි. ප්‍රකාශනයන්හි පිටපත් බැංකුවෙන් ඉල්ලා සිටිනු ලබන්නේ නම්, එම සේවාව ලබාදීම සඳහා බැංකුවේ ප්‍රකාශ කර ඇති බදු අනුව ගාසුතුවක් අයකිරීමට බැංකුවට අයිතිය ඇත.

(IV) බැංකුවේ නමට ඇති අණකර/ චෙක්පත් ගිණුමේ බැරකිරීම සඳහා ගෙවනු ලබන විට, බැංකුව විසින් ප්‍රකාශකර ඇති අයකිරීම් වලට අනුකූලව පරිහරණ ගාස්තු අඩුකරනු ඇත. බැංකුවේ පවත්නා ප්‍රතිපත්තිය මත පදනම්ව එකී තැන්පතුවල වලංගු දිනය බැංකුව මගින් තීරණය කරනු ඇත. බැංකුව නමට නොමැති අණකර/චෙක්පත් ඉතුරුම් ගිණුමට බැර කිරීම සඳහා මිලදී ගන්නා අවස්ථාවලදී පරිහරණ ගාස්තු වලට අමතරව බැංකුව විසින් ප්‍රකාශ කර ඇති අයකිරීම් වලට අනුකූලව සාධන පත්‍රයේ මුහුණත වටිනාකම මත බැංකුව විසින් වට්ටම් ගාස්තු ද අඩුකරනු ඇත.

(V) මුදල් තැන්පත් කිරීම නිරන්තරයෙන්ම සිදු කළ හැකිය. තැන්පතු පත්‍රිකාව මත බැංකුවේ බලයලත් නිලධාරියෙකුගේ අත්සන යටතේ අතින් කරනු ලබන සටහනක් මගින් මුදල් තැන්පතු පත්‍රිකාව වලංගු කිරීමෙන් සියළුම තැන්පතු පිළිගනු ඇත.බලයලත් අත්සන් සහ ආදර්ශ ටෙලර් අන්ත පිළිබඳ මුද්‍රිත පිටපතක් ඉල්ලීමක් කර පරීක්ෂා කර බැලිය හැකිය.

(VI) ප්‍රතිලාභියාගේ නම සහ ගිණුම් අංකයට පසුව "කළමනාකරු, නේෂන්ස් ට්‍රස්ට් බැංකුව" නමට ලියන ලද චෙක්පත් තැන්පතු, ශාඛා කළමනාකරුගේ අනුමැතියට යටත්ව පිළිගනු ලැබිය හැකිය.චෙක්පත් තැන්පතු සඳහා බැංකුව මගින් අවසර දෙනු ලබන අවස්ථාවන්හිදී, බැංකු ශාඛාවන්හි තබා ඇති චෙක්පත් තැන්පත් කිරීමේ බහාළුම් වල තැන්පත් කරන ලදැයි පැවසෙන චෙක්පත් වල මුදල් (තිබේ නම්) ගිණුමට බැර වී තිබේ නම් මිස එසේ තැන්පත් කළ බව පවසන ඕනෑම චෙක්පතක් සඳහා ගිණුම් හිමියා වෙත බැංකුව බැඳී නොසිටිනු ඇත. (තාවකාලික උපදෙස් ලබාදීමක් තිබියදී වුවද) . තැන්පතු බහාළුම මගින් නිකුත් කරනු ලබන තාවකාලින උපදෙස් තිබියදී වුවද, කවර හේතුවක් මත හෝ කවර අවස්ථාවකදී හෝ චෙක් පත් බහාළුමේ

තැන්පත් කරන ලද චෙක්පත් ගනුදෙනුකරුගේ ගිණුමට බැරවී නොමැතිනම් එසේ තැන්පත් කරන ලද චෙක් පත් පිළිබඳ කවර හෝ හිමිකම්පෑමක් බැංකුව මගින් බාර නොගනු ඇත.ගනුදෙනුකරුගේ ගිණුමට බැර කරන ලද චෙක්පත් එකතු කිරීම සඳහා පමණක් භාර ගන්නා අතර අණලද බැංකුව මගින් නිශ්කාෂණය කරන තෙක් මුදල් ආපසු ගැනීමට නොහැක. සඳහන් කිරීමේ කාර්යයන් සඳහා පමණක් අරමුදල් ඇති දිනයන් දක්වනු ලැබේ.

**මුදල් ආපසු ලබාගැනීම**

(VII) අදාළ නීති රීතීන්ට යටත්ව අවශ්‍ය ඕනෑම අවස්ථාවකදී ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර මගින් හෝ ශාඛාවලදී මුදල් ආපසු ගැනීම් සිදුකළ හැකිය.නේෂන්ස් සැලරි සේවර් ගිණුම යටතේ විශේෂිතව ඉවත්කර / සංශෝධනය කර නොමැතිනම් සහ ඒ බව මා වෙත දැනුම් දී ඇතිනම් මිස, ස්වයංක්‍රීය ටෙලර් කාඩ් ගාස්තු සහ අනෙකුත් බැංකුවල ටෙලර් යන්ත්‍ර මගින් මුදල් ආපසු ගැනීම සඳහා ගෙවිය යුතු ගාස්තු, බැංකුවේ පවත්නා අනුපාතයන් මත ගෙවිය යුතුය. (XII) වන වගන්තියේ අඩංගු විධිවිධානයන්ට යටත්ව ධනාත්මක හඳුනාගැනීමකින් පසුව ශාඛාවලදී මුදල් ආපසු ලබාගැනීමට ඉඩලබාදෙනු ඇත. බැංකුව මගින් එහි තනි අභිමතය පරිදි බැංකු කවුන්ටර වලදී මුදල් ආපසු ගබා ගැනීමට ඉඩ ලබාදිය හැකිය. මුද්දර ගාස්තු සහ වෙනත් බදු හෝ අයකිරීම්, අදාළවන අවස්ථාවලදී මා විසින් ගෙවිය යුතු අතර නීතියට අනුකූලව බැංකුව මගින් දක්වා ඇති ආකාරයට ගෙවීම් සිදුකළ යුතුය. මුදල් ආපසු ලබාගැනීම, චෙක්පත් හෝ වෙනත් යම් සාධන පත්‍රයක් මගින් හෝ සිදු කළ නොහැක.

(VIII) කෙසේවුවද, ඉහත (VI) වගන්තියේ දක්වා ඇති කරුණු වලට යටත්ව නේෂන්ස් සැලරි සේවර් ගිණුමේ හරයට ගෙවීම් සිදුකිරීම සඳහා මා විසින් සාධාරණ කාලයක් තුළ තැපැල් මගින් හෝ බැංකුවේ යම් ශාඛාවකට භාරදෙනු ලබන සත්‍යාපනය කරන ලද ලිඛිත උපදෙස් ( ස්ථාවර උපදෙස් ද ඇතුළුව) මත පමණක් බැංකුව කටයුතු කරනු ඇත. නිශ්චිත කාල රාමුවක් තුළ එම උපදෙස් මත කටයුතු කිරීමටඅපොහොසත්වීම මගින් පැන නැගෙන යම් හිමිකම්පෑම්, අලාභ සහ පිරිවැය පිළිබඳව බැංකුව බැඳී නොසිටින අතර ඒ පිළිබඳව වගකීමක් දරනු නොලැබේ. මා සහ බැංකුව අතර පවතින විශේෂිත ගිවිසුමකින් තොරව ෆැක්ස්, විද්‍යුත් තැපැල හෝ වෙනත් යම් ඉලෙක්ට්‍රොනික මාධ්‍යයක් මගින් ලැබෙන කිසිදු උපදෙසක් බැංකුව විසින් පිළිගනු නොගනු ඇත.

**පොලිය**

(IX) ඉතිරිකිරීමේ ගිණුම් සඳහා දෛනිකව පවත්නා ශේෂය මත වර්තමාන අනුපාතයට ගණනය කරනු ලබන පොලිය එම ගිණුමට මාසිකව බැර වනු ඇත. (සාමාන්‍යයෙන් මාසයේ අවසාන දින). එම පොලී ගෙවීම් , (VII), (X) සහ (XII) වගන්තිවල අඩංගු විධිවිධානයන්ට යටත්වේ.

(X) දේශීය ආදායම් දෙපාර්තමේන්තුව මගින් ඉල්ලා සිටින පරිදි මාගේ බදු තත්වය සහ පදිංචි තත්වය පිළිබඳ ව්‍යවස්ථාපිත ප්‍රකාශයක් ගිණුම් විවෘත කිරීමේ පත්‍රිකා මා විසින් සම්පූර්ණ කළ යුතුය. එකම විධි නියෝගය මගින් පාලනය වන දැනට පවත්නා සියළුම සහ නව ගිණුම් සඳහා, මා විසින් ලබාදෙනු ලබන ව්‍යවස්ථාපිත ප්‍රකාශය අදාළ වනු ඇත.දේශීය ආදායම් දෙපාර්තමේන්තුව හෝ වෙනත් එවන් බලධරයෙකු විසින් කලින් කලට නියම කරනු ලබන කාලයක් සඳහා ( එම අනුපාතයට හෝ අනුපාත වලට) පොලී ගෙවීම් මත ගෙවිය යුතු රඳවුම් බදු හෝ වෙනත් යම් බදු මුදලක් වේ නම් එය ගෙවිය යුතු පොලියෙන් බැංකුව මගින් අඩු කරගනු ඇත. දේශීය ආදායම් දෙපාර්තමේන්තුව මගින් බැංකුවෙන් පසුව ඉල්ලා සිටිනු ලැබුවහොත්, නොගෙවූ රඳවුම් බදු මාගෙන් අයකිරීමට ( දැනුම්දීමකින් තොරව) බැංකුවට අයිතිය ඇත.

**පොදු කරුණු**

(XI) මාගේ ලිපිනයේ යම් වෙනසක් සිදුවුවහොත් ඒ බව වහාම ලිඛිතව බැංකුවට දැනුම්දිය යුතුය.

(XII) බැංකු කවුන්ටරවලදී සිදුකරනු ලබන ගනුදෙනු සහ/හෝ ටෙලර් යන්ත්‍ර මගින් සිදුකරනු ලබන ගනුදෙනු සඳහා බැංකුවට එහි තනි අභිමතය පරිදි වෙනවෙන් ගනුදෙනු ගාස්තු අයකළ හැකිය.විවෘත කළ දින සිට මාස තුනක කාලයක් තුළ ගන්දෙනුකරු විසින් වසාදමනු ලබන ගිණුම් මත පරිහරණ ගාස්තුවක් අයකරනු ලැබිය හැකිය. දැනට අදාළවන ගාස්තු සහ ගෙවීම් පිළිබඳ තොරතුරු, ඉල්ලීමක් කර ලබාගත හැකි බැංකුවේ බදු පිළිබඳ පොත් පිංචෙහි අඩංගු වේ.

(XIII) අයකරනු ලබන  සේවා ගාස්තුව පවත්නා මාසය තුළදී හෝ ඊළඟ මාසයේදී මාගේ ගිණුමෙන් හර කරනු ලැබිය හැකිය.

(XIV) ප්‍රකාශන පිටපත් සහ/හෝ ගනුදෙනු වාර්තා වසර 07ක කාලයක් සඳහා පමණක් බැංකුව විසින් රඳවාතබා ගනු ඇත.එම සියළුම වාර්තා වසර 7කට පසුව විනාශවී යනු ඇති අතර වසර 7 කට පසුව ප්‍රකාශන හෝ ගනුදෙනුවල පිටපත් ලබාදීම සම්බන්ධව බැංකුව කිසිදු බැඳීමක් හෝ වගකීමක් හෝ නොදරනු ඇත.

(XV) බැංකුවේ තනි අභිමතය පරිදි කටයුතු නොකරන්නේ නම් මුදල් තැන්පතු සහ ආපසු ගැනීම්, චෙක්පත් තැන්පතු සහ වෙනත් හර/බැර ගනුදෙනු සඳහා ගනුදෙනුකරුට ලබාදෙන උපදෙස් බැංකුව මගින් වෙන් වෙන්ව යැවීමක් සිදු නොකරනු ඇත.

(XVI) කිසිදු දැනුම්දීමකින් තොරව, ඔබගේ වෙනත් ඕනෑම ගිණුමක් හෝ බැංකුව සමග ගිණුම් හිමිකරුට පවතින තත්‍ය හෝ අසම්භාව්‍ය, ප්‍රාථමික හෝ සමාන්තර, එක්ව හෝ වෙන් වෙන්ව හෝ පවතින වෙනත් යම් බැඳීමක් සමග ඔබගේ ගිණුම/ගිණුම් ඒකාබද්ධ කිරීමට සහ ඔබගෙන් බැංවකුට අයවිය යුතුව පවතින වෙනත් යම් මුදලක්/මුදල් වෙනුවට වෙනත් යම් ගිණුමක/ගිණුම්වල හෝ වෙනත් යමකට අදාළව ගිණුමේ හරට පවතින යම් මුදලක්/මුදල් හිලව් කිරීමට හෝ මාරු කිරීමට බැංකුවට හැකියාව පවතී.

(XVII) අවසන්වරට සටහන් වී ඇති ගිණුම්හිමිකරුගේ ලිපිනයට දැනුම්දීමෙන් පසුව හෝ ගිණුම්හිමිකරු බැංකුව සමග ලියාපදිංචිවී ඇති  ඊ-මේල් හෝ කෙටි පණිවුඩ හෝ වෙනත් ඕනෑම ඩිජිටල් මාධ්‍යයක් ඔස්සේ දැනුම් දීමක් සිදුකිරීම මගින් යම් ගිණුමක් විවෘත කිරීම ප්‍රතික්ශේප කිරීමට සහ/හෝ හේතු නොදක්වා යම් ගිණුමක් වසා දැමීමට බැංකුවට අයිතිය ඇත.ගිණුම්හිමිකරුගේ ගිණුමේ ශේෂය බින්දුවක් වන විට එම ගිණුම අවහිර කිරීමටද බැංකුවට අයිතිය ඇත.එසේ ගිණුමේ ශේෂය බින්දුවක්  සහ මාස තුනක (3) කාල සීමාවක් සඳහා අක්‍රියව පවතින ගිණුම් සඳහා ඒවා වසා දමන බවට වන දැනුම්දීමක් ගිණුම්හිමිකරුගේ අවසන්වරට සටහන් වී ඇති ලිපිනයට ලබාදී දින හතකට (7) පසුව එම ගිණුම් වසා දැමීමටද බැංකුවට අයිතිය ඇත.

(XVIII) නිතිය මගින්, රජයේ රෙගුලාසි හෝ ශ්‍රී ලංකා මහ බැංකුවේ උපදෙස් පරිදි අවශ්‍යවේ නම් නියමයන් සහ කොන්දේසි ස්වයංක්‍රීයව සංශෝධනය වනු ඇත.

(XIX) මෙම නේෂන්ස් සේවර් ගිණුම විවෘත කිරීම හෝ පවත්වා ගැනීම මගින්, ඉතුරුම් ගිණුමක පැවැත්ම පාලනය කරනු ලබන බැංකුවේ නියමයන් සහ කොන්දේසි මා විසින් කියවා අවබෝධ කර ගත් බවත් ඒ මගින් බැඳී සිටින බවත් සළකනු ලැබේ. ඉහත 8 වන වගන්තියේ අඩංගු විධිවිධානයන්ට යටත්ව මෙම නියමයන් සහ කොන්දේසි වෙනස් කිරීමට, නවීකරණය කිරීමට හෝ අළුතින් එක් කිරීම් සිදුකිරීමට බැංකුවට අයිතිය ඇත.

(XX) මාගේ ගිණුම් තොරතුරු ද ඇතුළත්ව සියළුම දත්ත හුවමාරු කිරීම සහ/හෝ ගබඩා කිරීම හෝ ඕනෑම ස්ථානයක තබා ගැනීම සහ බැංකුවේ, එහි ප්‍රධාන කාර්යාලයේ, ශාඛා කාර්යාලවල අවසරලත් පුද්ගලයින්ට ඒ වෙත ප්‍රවේශවීම හෝ අවශ්‍ය බව බැංකුවේ මතය වන අවස්ථාවන්හිදී එම තොරතුරු බැංකුවේ අවසරලත් පුද්ගලයින්ට, ඕනෑම දත්ත සැකසුම් සේවා සපයන්නෙකුට සහ/හෝ ශේෂ පත්‍ර මුද්‍රණය කිරීම සහ තැපැල් කිරීම සඳහා හෝ ඒ හා සමාන ඕනෑම සේවාවක් ලබාගැනීම සඳහා බැංකුව මගින් යොදවාගන්නා ඕනෑම තෙවන පාර්ශවයක් මගින් එම තොරතුරු හුවමාරු කිරීමට සහ/හෝ ගබඩා කිරීමට හෝ ඕනෑම ස්ථානයක රඳවා ගැනීමට මා එකඟ වන අතර ඒ බව පිළිගනී.

(XXI) බැංකුව මගින් මුදල් විශුද්ධිකරණය, ත්‍රස්ත මූල්‍යකරණය වැළැක්වීමට අදාළ නීති වලට අනුකූලව කටයුතු කිරීම සහ අනුමැතීන්ට යටත්ව ඕනෑම පුද්ගලයෙකුට හෝ අස්ථිත්වයකට මූල්‍ය සහ වෙනත් සේවාවන් සැපයීමට අවශ්‍ය වේ.එමනිසා, එම නීති සහ රෙගුලාසි වලට අනුකූලව කටයුතු කිරීම මැනැවැයි බැංකුවේ තනි සහ පරම මතය අනුව හැඟෙන ඕනෑම ක්‍රියාවක් සිදු කිරීමට බැංකුවට හිමිකම ඇත.

(XXII)

(අ) එම සියළුම නීති සහ රීතිවලට අනුකූලව කටයුතු කිරීමට සුදුසුයැයි බැංකුව විසින් සළකනු ලබන යම් පියවරයන් මගින් නියමයන් සහ කොන්දේසි හෝ වෙනත් බැඳීම් යටතේ එහි රාජකාරී කටයුතු ඉටුකිරීමේදී සම්පූර්ණයෙන්ම හෝ අර්ධ වශයෙන් සිදුවන යම් ප්‍රමාදයක් හෝ අපොහොසත්වීමක්

හෝ

(ආ) මෙම වගන්තිය යටතේ ක්‍රියාවේ යොදවනු ලබන බැංකුවේ යම් අයිතියක්

හේතුවෙන් යම් පාර්ශවයකට දැරීමට සිදුවන හානි (සෘජු හෝ ආනුශංගික සහ සීමාවකින් තොරවූ ලාභ හෝ පොලී අලාභ ඇතුළත්ව) හෝ පාඩු සඳහා බැංකුව බැඳී නොසිටිනු ඇත.

අදාළ වන ඕනෑම නීති සහ රෙගුලාසිවල අභිබවා යන අවශ්‍යතාවලට යටත්ව, සාධාරණ ලෙස ප්‍රායෝගික වූ වහාම එවැනි තත්ත්වයන් පවතින බව මාහට දැනුම් දීමට බැංකුව උත්සාහ කරනු ඇත.

(XXIII) පොලී ගණනය කිරීම (හෝ වෙනත් ප්‍රතිලාභයක්) සම්බන්ධයෙන් බැංකුව විසින් වැරදි ඇතුළත් කිරීමක් සිදු කළ දිනට පසුකාලීනව ඇතුළත් කිරීම් ක්‍රියාත්මක කළ යුතු වන යම් ගිණුමකට යොදා ඇති වැරදි සටහන්, ඊළඟ ශේෂ ප්‍රකාශය නිකුත් කිරීම පෙර හෝ පසුව බැංකුව විසින් හර සටහන්

(ප්‍රත්‍යාවර්ත සටහන්) මගින් ප්‍රත්‍යාවර්ත කිරීම, නිවැරදි කිරීම හෝ අවලංගුකිරීම සිදුකරනු ලැබිය හැකිය.

(XXIV) මෙහි අඩංගු නියමයන් සහ කොන්දේසිවලට අමතරව ගිණුමක් විවෘත කිරීමට පෙර සියළුම ගිණුම් හිමිකරුවන් වෙත නිකුත් කරනු ලබන බැංකුවේ පොදු ව්‍යාපාරික කොන්දේසීන්හි ඇතුළත් කර ඇති නියමයන් සහ කොන්දේසි මගින් ද මා බැඳී සිටිනු ඇත. එකී නියමයන් සහ කොන්දේසි පොදු ව්‍යාපාරික කොන්දේසීන්හි ඇතුළත් වූවද නොවූවද මෙහි අඩංගු සියළුම නියමයන් සහ කොන්දේසි මගින් මා සම්පූර්ණයෙන්ම බැඳී සිටිනු ඇත.